කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

**සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය**

**සංචරණය සඳහා දෘශ්‍ය මාධ්‍ය - TCRM 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. දෘශ්‍ය මාධ්‍ය යන්න සවිස්තරාත්මකව හඳුන්වා දී, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තය සඳහා දෘශ්‍ය මාධ්‍යයන්ගේ වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 20 යි)

02. දෘශ්‍ය මාධ්‍ය අතීතයේ සිට විවිධ යුග පසු කරමින් විප්ලවීය වෙනසකට වර්තමානයේ පත්වී තිබේ. දෘශ්‍ය සන්නිවේදනයේ ඉතිහාසය සහ විකාශනය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.
(ලකුණු 20 යි)

03. "වාර්තා වැඩසටහන් (Documentaries) යනු සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට යොදාගත හැකි ප්‍රබල මාධ්‍යයකි." සංචාරක වාර්තා වැඩසටහන් නිදසුන් ලෙස යොදා ගනිමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 20 යි)

04. තිර පිටපතක් රචනය කිරීමේ දී සැළකිය යුතු ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් සඳහා විස්තරාත්මක තිර පිටපතක් නිර්මාණය කරන්න. (ලකුණු 20 යි)

05. සංචාරක ක්ෂේත්‍රයේ චාරිකා නියෝජිතායතන (Travel Agencies) හා සංචාරක හෝටල් විසින් ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස අත්පත්‍රිකා (Brochures) උපයෝගී කර ගැනීමේ වැදගත්කම පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20 යි)

06. සංචාරකයෙකුගේ සංචාරක ගමනාන්ත තීරණය (Destination Choice) කිරීම කෙරෙහි සමාජ මාධ්‍ය (Social Media) හරහා සිදුකරනු ලබන බලපෑම විශ්ලේෂණය කරන්න.
(ලකුණු 20 යි)

07. මාර්ගගත සංචාරක සේවා වෙන් කිරීමේ වෙබ් අඩවි (online booking platform) සහ අන්තර්ජාලයේ පවතින සංචාරක මාර්ගෝපදේශන වෙබ් අඩවි (online travel guide websites) සංචාරක ව්‍යාපාරයට හා සංචාරක ගමනාන්ත වල ප්‍රතිරූපයට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 20 යි)

08. සංචාරක හෝටලයක් සතුව ආකර්ශනීය වෙබ් අඩවියක් පැවතීමේ වැදගත්කම හා එබඳු වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේදී සැළකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු පිළිබඳව නිදසුන් ඇසුරින් පැහැදිලි කිරීමක් කරන්න.
(ලකුණු 20 යි)

*******************************